# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை

# (SRI LANKA EXPORT DEVELOPMENT BOARD)

## වෙළඳ අමාත්‍යාංශය

## ඇබෑර්තු

අපනයන ප්‍රවර්ධනය සඳහා වගකිව යුතු ඉහළම රාජ්‍ය වෙළඳ ආයතනය ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), රජයේ අපනයනය සඳහා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. රටට වැඩි විදේශ විනිමය ඉපැයීමයට හැකිවන සේ පුද්ගලික අංශයට ඔවුන්ගේ අපනයන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සහ මග පෙන්වීම සඳහා උපාය මාර්ග හා වැඩ සටහන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ අපනයනයේ එවැනි වර්ධනයක් අත් කර ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරීත්ව කණ්ඩායමට එක්වන ලෙස විශිෂ්ට නායකත්ව කුසලතා සහිත ස්වයං අභිප්‍රේරිත වෘත්තිකයන්ට ආරාධනා කරනු ලැබේ.

### (1) අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ HM 1-1

නව ඩිජිටල් අලෙවිකරණය සඳහා තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩල කණ්ඩායමට නායකත්වය දීම, තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා ව්‍යාපාරික අවශ්‍යතා තීරණය කිරීම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සංවිධානය සහ බාහිර පාර්ශ්වකරුවන් සඳහා අවශ්‍ය ආරක්ෂක පියවරයන් ආපදා ප්‍රතිසාධන සැලසුම් සහ තොරතුරු තාක්ෂණ සේවා විධිමත් ලෙස සැපයීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.

ආයතනයට තොරතුරු තාක්ෂණ සේවා සැපයීම, වෙළඳ ද්වාරයක් පවත්වාගෙන යාම, EDB වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, විද්‍යුත් සන්නිවේදනය, ඊ-ප්‍රවර්ධනය යනාදිය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් කිරීම සහ තීරණ ගැනීම යන කරුණු අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ. සංවිධානයේ වර්තමාන සහ අනාගත ව්‍යාපාරික අරමුණු සපුරාලීම සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීම. පරිගණක දෘඩාංග මෘදුකාංග භාවිතය, ප්‍රවේශය සහ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ඊ-රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව සන්නායක තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම. තොරතුරු තාක්ෂණ සම්පත් සැලසුම් කිරීම, අයවැයකරණය, මෙහෙයුම් මුලපිරීම සහ කාර්ය සාධනය සහ ප්‍රතිඵල අධීක්ෂණය කිරීම සහ අංශයේ සමස්ත පරිපාලනය.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ, පරිගණක විද්‍යාව හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක් සඳහා උපාධියක් ලබා තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාව/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) පළපුරුද්දක් ලබා තිබිම.

### (2) අධ්‍යක්ෂ - අපනයන සේවා HM 1-1

සේවා අපනයනය යනු රටේ අපනයන සහ විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම් සඳහා ඉහළ විභවයක් සහිත අභියෝගාත්මක අංශයකි. සමුද්‍ර හා අක් වෙරළ ඉංජිනේරු, අධ්‍යාපන, සුවතා සංචාරක ව්‍යාපාරය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / බීපීඑම් (ICT/BPM) සමග ඉලෙක්ට්‍රොනික් පරිවර්තනය වැනි නව අංශ මෙම ක්ෂේත්‍රය තුළ මතුවෙමින් තිබේ.

තෝරා ගත් (ICT/BPM) ආශ්‍රිත සේවාවන් ඇතුළු වෘත්තීය සේවා, සැපයුම් වැඩ සටහන්, තාක්ෂණික සංවර්ධනය, ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඇසුරුම් සංවර්ධන හා පුහුණුව ඇතුලත් නිෂ්පාදන වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා වගකිව යුතුයි. එම නිෂ්පාදන අපනයන වෙළඳ පල අවශ්‍යතාවයන්ට අනුවර්තනය කිරීම, මෙයට අදාළ මානව සම්පත් සංවර්ධනය හා පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම අංශයේ සමස්ථ පරිපාලනය සිදු කිරීම.

### (3) අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන HM 1-1

කාර්මික නිෂ්පාදන අපනයනය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ විභවයක් ඇති රටේ ප්‍රධාන විදේශ විනිමය උපයන්නා වේ. මෙම අංශවලට සම්ප්‍රදායික අංශ වන ඇගළුම්, රබර්, මැණික් හා ස්වර්ණාභරණ ආදිය ඇතුලත් වන අතර, නැගී එන අංශ වන බෝට්ටු සහ නැව් තැනීම, ඖෂධ, මෝටර් රථ උපාංග ආදිය ඇතුලත් වේ.

සැපයුම් සංවර්ධනය, තාක්ෂණික සංවර්ධනය, ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම, ඇසුරුම් සංවර්ධනය හා පුහුණුව, නිෂ්පාදන සංවර්ධනය ආරම්භ කිරීම සහ එම නිෂ්පාදන අපනයන වෙළඳ පලට අනුවර්තනය කිරීම ඇතුළු ඒකාබද්ධ වැඩ සටහන් තුළින් තෝරා ගත් කාර්මික නිෂ්පාදන සමූහයක අපනයන කාර්ය සාධනය වැඩි දියුණු කිරීම අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ. මෙයට අදාළ මානව සම්පත් සංවර්ධනය සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම අංශයේ සමස්ත පරිපාලනයද ඇතුලත් වේ.

**සුදුසුකම් (2) සහ (3) :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක අලෙවිකරණ / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම. අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) පළපුරුද්දක් ලබා තිබිම.

**වැටුප් පරිමාණය (1), (2) හා (3) - HM 1-1 :** රු. 80,295/- 15 X 2270 - රු. 114,345/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

ඉහත සඳහන් සියලුම තනතුරු සඳහා වයස අවුරුදු 55 ට අඩු ඉහළ නිපුණතා ඇති පුද්ගලයින් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ඇරයුම් කරයි. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යාවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා චක්‍රලේඛ අනුව
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙළ**

ඔබ සුදුස්සකු නම්, 2021.03.01 හෝ ඊට පෙර ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට මෙයින් ආරාධනා කෙරේ.

අදාළ අයදුම්පත්‍රය අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ **www.srilankabusiness.com** වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබා ගත හැක. ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ තනතුරු නාමය සඳහන් කරමින් සම්පූර්ණ ජීව දත්ත සඳහන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ සියළුම සහතික පත්‍රවල පිටපත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. **නියමිත අයදුම්පත්‍රය (EDB අයදුම්පත්‍රය) හා අදාළ සහතිකවල පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගිනි.


**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB - EDB ටවර්, අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුර : 011 - 2300700, ෆැක්ස් : 011 - 2300715**

**වෙබ් : www.srilankabusiness.com**